## 1.1 හැඳින්වීම

සමස්ත ජනමාධ්‍ය පද්ධතිය තුළ සමාජීය ජීවිතය මෙන්ම පුද්ගලික ජීවිතය කෙරෙහි ප්‍රබල බලපෑමක් සිදුකරමින් පවත්වාගෙන යනු ලබන මාධ්‍ය වන්නේ රූපවාහිනී මාධ්‍යයි. එය ජනමතය, ජනවිඥානය, හැඟීම් හා සංවේදීතාවයන් අපේක්ෂිත ප්‍රවණතාවයන් ඔස්සේ හැඩගැස්වීමට සමත් මෙවලමකි. මනෝවිද්‍යාත්මකව අවධාරණය කර ඇති ආකාරයට රූපවාහිනී මාධ්‍ය සතු ශ්‍රව්‍ය දෘශ්‍ය හැකියාව ග්‍රාහක මනසට ප්‍රබල ලෙස බලපායි. මෙම රූපවාහිනී මාධ්‍ය පරිශීලනයේ සමාජ බලපෑම අද්‍යතනයේදී උභතෝකෝටිකයක් බවට පත්ව තිබේ. එය අවබෝධයකින් යුතුව පරිශීලනය කළ යුත්තකි. අතිශයින් දියුණු මාධ්‍යයක් වශයෙන් ලොව පුරා ව්‍යාප්ත වන රූපවාහිනිය ලාංකේය සමාජය තුළද විවිධ සංස්කෘතික හා සමාජීය විපර්යාසයන් සිදු කිරීමට දායක වී තිබේ. විශේෂයෙන්ම රූපවාහිනී මාධ්‍ය සතු රූප භාෂාවේ ශක්‍යතාවය නිසා සමාජානුයෝජන කාරකයක් ලෙසද අනෙකුත් කලා මාධ්‍යයන් අතර කැපී පෙනෙයි. එසේම රූපවාහිනී මාධ්‍ය සුවිශේෂවන්නේ අති විශාල පිරිසකට ඉතා පහසුවෙන් අදාළ නිර්මාණ සමීප කරවීමට ඇති හැකියාව නිසාය.

රූපවාහිනිය මූලික වශයෙන් දර්ශනය හා බැලීම මුඛ්‍ය කර ගනිමින් නිර්මිත වූවක් වන අතර ඒ හරහා ප්‍රේක්ෂකයා වෙත විවිධ වූ අර්ථ හා සුබ සම්පාදනය කරනු ලබයි. එසේම ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් අද්‍යතනයේ සැළකුම් ලබන රූපවාහිනිය ශිෂ්ටාචාර ගත මිනිසාගේ දෘශ්‍ය සන්නිවේදනයට තිබූ රුචිකත්වයේ වර්ධනීය අවස්ථාවක් ලෙස සැලකේ. රූපවාහිනිය අත්‍යන්තයෙන්ම බහු ජනයාගේ නොහොත් ජනතාවගේ මාධ්‍යයයි. රූපවාහිනී කලාවේ භාවිතයත්, එයට අඩංගු වන තාක්ෂණයත්, ශිල්ප ක්‍රමත්, ශිල්පීන්ගේ පුහුණුවත්, මනසත් විග්‍රහ කරන විට රූපවාහිනිය අනෙකුත් සියලුම කලා මාධ්‍ය වලින් පමණක් නොව ගුවන්විදුලි ශිල්පය සහ ප්‍රවෘත්ති පත්‍ර කලාව යනාදියෙන් පෝෂණය වූ කලාවක් බවද පෙනේ.

ගෝලීයකරණයේ මූලික ප්‍රපංචයක් බවට පත්ව ඇති රූපවාහිනී මාධ්‍ය හරහා වත්මන් මිනිසා ඉතිහාසයේ මුල්ම වතාවට එකම මොහොතක එකම අත්දැකීමක් ලබන ලෝක පවුලක සාමාජිකයෙකු බවට පත්ව ඇත. රූපවාහිනී මාධ්‍යයේ නැගීම හා ව්‍යාප්තිය සන්නිවේදන ඉතිහාසයේ ඉතා ශීඝ්‍රයෙන් සිදුවිය. විශේෂයෙන්ම රූපවාහිනී ටෙලි නාට්‍ය ඒ ව්‍යාප්තියේ හා නැගීමේ එක් අංගයක් ලෙස හැඳින්විය හැකිවේ. ප්‍රේක්ෂකයින් විවිධ රුචිකත්වයන්ට හුරු කරවීමේ ආකර්ශනීය අංගයක් ලෙස රූපවාහිනී ටෙලි නාට්‍ය යොදාගනී. අද්‍යතන රූපවාහිනී ටෙලිනාට්‍ය, ප්‍රේක්ෂකයා ආලින්දයේම රඳවා තබා ගන්නා කලා මාධ්‍යයක් බවට පත්ව තිබෙන්නේ විශාල කාල පරාසයක් ද එයට නතුකර ගනිමිනි. ටෙලි නාට්‍ය නරඹන ග්‍රාහකයා බොහෝ වේලාවට එය තම ආගම බවට පත්කර ගනී. නිරතුරුවම ටෙලිනාට්‍ය නැරඹීමට හුරුවී ඇති ප්‍රේක්ෂකයාගේ සමාජ විඥානය සකස්වීම සඳහා ටෙලි නාට්‍යයන් හි මතවාද ප්‍රබල බලපෑමක් සිදුකරනු ලබයි. එය සාධනීය කරලීමේ පහසුව තකා අදාල ටෙලිනාට්‍යයේ රූපරචනය, ආලෝකකරණය, සංස්කරණය, කලා අධ්‍යක්ෂණය, රංගන දායකත්වය මෙන්ම අධ්‍යක්ෂණයද එක සේ බලපායි. ප්‍රේක්ෂකයා රූපවාහිනී තිරය ඉදිරිපිට හිඳ සැප පහසු ලෙස ටෙලි නාට්‍ය රසවින්දද එහි තිරය පිටුපස ඇත්තේ ඉතාමත් වෙහෙසකර කාර්යභාරයකි. ඒ පිළිබඳව ක්ෂේත්‍රයෙන් බැහැර බොහෝ අයට අවබෝධයක් නොමැත. ටෙලිනාට්‍යක් යනු සාමූහික ප්‍රයත්නයකි. එය ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කළ යුත්තේ සාර්ථක

නිර්මාණයක් ලෙසිනි. රූපවාහිනී ටෙලිනාට්‍ය මුළු මහත් සමාජ පද්ධතියටම බලපාන හෙයින් මෙම සුවිශේෂී මාධ්‍ය පරිහරණය කළ යුත්තේ ඉතාමත් බුද්ධිමත්වය. රූපවාහිනී ටෙලි නාට්‍ය සඳහා යොදා ගන්නා තාක්ෂණය මෙන්ම ශිල්ප ක්‍රමද දිනෙන් දින බොහෝ වෙනස්කම් වලට භාජනය වෙමින් පවතී. එය ටෙලිනාට්‍යයේ නිර්මාණාත්මක භාවය මෙන්ම ගුණාත්මක භාවය සඳහා උචිත ලෙස උපයෝගී කර ගැනීම සිදුකළ යුතුව ඇත.

අද්‍යතනයේ ඉතා කෙටිකාලයක් තුළ ටෙලිනාට්‍ය විශාල සංඛ්‍යාවක් බිහිවී ඇති අතර ඉන් බොහොමයක් සාර්ථක ටෙලි නිර්මාණ යැයි කිව නොහැකිය. ඒවායේ ගුණාත්මකභාවය පිළිබඳ මතභේදාත්මක කරුණු පවතී. පොදුවේ ටෙලිනාට්‍යයක් ගත් කළ රූපරාමු, දෙබස්, පසුබිම් සංගීතය හා ශබ්ද එක්තැන් කොටගෙන යම්කිසි ආකාරයක සමාජීය ගැටලුවක් විදහා දැක්වීම කරණු ලබයි. නමුත් මෙම ප්‍රවණතාවය අද්‍යතන ටෙලිනාට්‍ය තුළදී විවිධ වෙනස්කම් වලට භාජනය වෙමින් පවතී. සමාජය නැමති ප්‍රපංචය තුළ නිරූපණය පමණක් නොව සමාජයට බලපෑම් කළ හැකි අංගයක් ලෙසද සිය භූමිකාව ගොඩනගාගෙන ඇති ටෙලිනාට්‍ය තුළ ගුණාත්මක භාවය පිළිබඳ සාධනීය හා නිශේධනීය කරුණු සියුම්ව අධ්‍යයනය කිරීම සමස්ත සමාජයේ මෙන්ම ටෙලි නාට්‍ය කර්මාන්තයේ අභිවෘද්ධියටද හේතුවේ.

වර්තමානය වන විට ප්‍රේක්ෂකයා ටෙලි නාට්‍යයේ අන්තර්ගතය රූප රචනය ආදී විවිධ අංශයන් හි ගුණාත්මක භාවය කෙබඳු තත්වයක පැවතුනත් මහත් උනන්දුවකින් හා ආශාවෙන් ටෙලි නාට්‍ය නැරඹීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. එයට හේතුව ප්‍රේක්ෂකයාගේ රසවින්දන ශක්‍යයතාවයේ දුර්වලතාද නැත්නම් ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයේ වගකිවයුතු පුද්ගලයින්ගේ නොසැළකිලිමත් භාවයද නොඑසේනම් වෙනත් බාහිර බලවේගයන්ද යන්න පිළිබඳ පර්යේෂණ කර බැලීම කාලීන වශයෙන් වැදගත් වේ.

මෙම තත්වය යටතේ මාගේ පර්යේෂණ නිබන්ධනය සඳහා පාදක වනුයේ "අද්‍යතන රූපවාහිනී මාධ්‍ය තුළ ශ්‍රී ලාංකේය ටෙලි නාට්‍යයේ ගුණාත්මක භාවය පිළිබඳ කෙරෙන අධ්‍යයනය" කි. ලාංකේය සමාජය තුළ මුල් බැසගත් ටෙලිනාට්‍යයේ ගුණාත්මක භාවය පිළිබඳව පර්යේෂණාත්මකව විමසා බැලීම සමාජීය හා ක්ෂේත්‍රයීය ඵලදායීතාව වර්ධනය වීම උදෙසා සාධකයක් වනු ඇත. මේ සඳහා රූපවාහිනී ටෙලිනාට්‍ය නිෂ්පාදනය කරන පිරිසගෙන්, නරඹන ප්‍රේක්ෂකයන්ගෙන් මෙන්ම බුද්ධිමතුන්ගෙන් හා විචාරකයන්ගෙන් ලබාගන්නා තොරතුරු මත ටෙලිනාට්‍ය ගුණාත්මක භාවයේ යථාර්තය පර්යේෂණාත්මක ලෙස අධ්‍යයනය කිරීමට හැකිවනු ඇත. ටෙලි නාට්‍ය නැරඹීම, අධ්‍යයනය කිරීම, විචාරය කිරීම හරහා මෙකී යථාර්තය තව දුරටත් සාක්ෂාත් කර ගැනීමට හැකිවනු ඇත.

සැබවින්ම ලෝකයේ ටෙලි නාට්‍ය ආරම්භ වූයේ විනෝදාස්වාදය (Entertatment) මූලික කරගෙනය. බොහෝ විට ඒවා විශාල කොටස් ගණනකින් යුත් සරල ටෙලි නාට්‍යයන් විය. නමුත් ලංකාවේදී මුල්කාලීනව ටෙලි නාට්‍ය ස්ථාපිත වූයේ ශ්‍රී ලංකාවට ආවේනික ලක්ෂණ වලින් යුත් ගුණාත්මක ප්‍රවණතාවයකින් හෙබි නාට්‍ය වශයෙනි. අද්‍යතනය වන විට මෙම ගුණාත්මක ප්‍රවණතාවය විවිධ ගැටලු වලට ලක්වී ඇත. එය අධ්‍යයනය කර සුදුසු විකල්ප ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.